# ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරී ඛණ්ඩ 1 සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පටිපාටිය

## 01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
යොමු අංකය : ජාලේ 5/20/50 — දිනය : 2010.12.09
ජාලේ 7/1/11 — 2018.03.05

1.2 අමාත්‍යාංශය : ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය
යොමු අංකය : NH/1/10/111 — දිනය : 2012.01.24
අධ්‍යාපන අමාත්‍යාංශය
යොමු අංකය : ඊඩී/05/67/26/02/23 — 2018.04.12

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :
යොමු අංකය : DMS/C04/29-04 — දිනය :2011.09.27
DMS/1135 Vol –I — 2016.09.15
2017.02.08
2017.02.17

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST-3/RECRU/04/6425 — දිනය :2011.06.28
EST-2/04/REC/10721 — 2018.07.09

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NSCC/4/29/4/SR-1 — දිනය :2011.07.06
NSCC/05/38/74/SR-III — 2018.05.10

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PSC/EST/3/1/21/2012 — දිනය:2012.03.26
PSC/EST/3/1/21/2012 — 2018.09.20

**02.** පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්

## 03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී ඛණ්ඩ 1
3.2 ශ්‍රේණි : II, I ශ්‍රේණි

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් කාර්යයන් ඉටුකිරීම සඳහා බඳවා ගැනීමේදී අවම මූලික සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරිනමන උපාධි සුදුසුකම් සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය පිළිබඳ කුසලතා අවශ්‍යවන්නාවූ ද, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන්ගේ හා ප්‍රධානීන්ගේ කාර්යභාරයට සෘජුවම උපස්ථම්භක වන්නාවූ ද, විධායක නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණය යටතේ පවරනු ලබන්නා වූ කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

**04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය** : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

**05. වැටුප්**

5.1 වැටුප් කේත අංකය : **MN6 – 2016**

5.2 මාසික වැටුප් පරිමාණය : **රු.** 36,585 – 10x660 – 11x755 – 15x930 – රු. 65,440/=

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| **ශ්‍රේණිය** | **ආරම්භක වැටුප් පියවර** | **වැටුප් තලය (රු.)** |
|---|---|---|
| II | පියවර 01 | 36,585/= |
| I | පියවර 12 | 43,940/= |

සටහන : - 2016.01.01 සිට 2020.01.01 දක්වා වැටුප් ගෙවිය යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 උපලේඛන II හි සඳහන් පරිදි ය.

**06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සහකාර ලේඛනාරක්ෂක | II/I | 8 | සුරක්ෂිතාගාරවල ලේඛන පරිපාලනය, අධිලේඛන මුද්‍රණය කිරීම, අධිකරණය හමුවේ කරුණු දැක්වීම, ලේඛන ආබද්ධ කර ගැනීම හා ඒ සඳහා ක්‍රමෝපාය සැකසීම, මහජන විමසීම් හා පර්යේෂණ කාර්ය සඳහා සහාය වීම, ප්‍රදර්ශන, වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය හා මෙහෙයවීම හා ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන තනතුරට අදාළ අනෙකුත් කාර්යයන් |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| **තනතුර** | **සංඛ්‍යාව** |
|---|---|
| සහකාර ලේඛනාරක්ෂක | 08 |
| එකතුව | 08 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා II, I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

**07. බඳවා ගැනීමේ ක්‍රමය** : මෙම තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ ද පසුව එම තනතුරු අහෝසි වීමට යටත්ව ද අනුමත කර ඇති බැවින් බඳවා ගැනීමේ ක්‍රමය අදාළ නො වේ.

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට පත්වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය |

(1 වන කාර්යක්ෂමතා කඩඉම් විෂය නිර්දේශය ඇමුණුම 1 හි ද, 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශ ඇමුණුම 2 හි ද දැක්වේ.)

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වර්ෂයකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද : ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

## 09. භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබාගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. සේවා ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.
VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සටහන
සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතු ය.

**11. තනතුරු වලට පත් කිරීම : අදාළ නො වේ.**

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාළ නො වේ.**

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :**

"සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : (ඇමුණුම 03 මගින් දැක්වේ.)**

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

**16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.**

**17. අන්තර්කාලීන විධිවිධාන** : අදාළ නොවේ.

| | | | |
|---|---|---|---|
| සකස් කළේ | : | පරීක්ෂා කළේ | : |
| අත්සන | :........................................ | අත්සන | :........................................ |
| නම | : ආර්.පී.එන්.ආර්.කේ. රාජපක්ෂ | නම | : බී.එම්. නිසංසලා බාලසූරිය |
| තනතුර | : පරිපාලන නිලධාරී | තනතුර | : සහකාර අධ්‍යක්ෂ (පාලන) |
| දිනය | : 2018.11.19 | දිනය | : 2018.11.19 |

බී. එම්. නිසංසලා බාලසූරිය
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව,
නො. 07, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :........................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ආචාර්ය නදීරා රූපසිංහ

තනතුර : ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2018.11.19

ආචාර්ය නදීරා රූපසිංහ
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
අංක. 07, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

නිල මුද්‍රාව :

---

යොමු අංකය -:........................................

2018.09.20 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 1 සේවා ගණයේ තනතුරු සඳහා වන මෙම උසස් කිරීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන :........................................

නම :........................................

ලේකම්,
සංස්කෘතික, අභ්‍යන්තර කටයුතු හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය

දර්ශනා සේනානායක
ලේකම්
සංස්කෘතික, අභ්‍යන්තර කටයුතු හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය
15 වන මහල, "සුහුරුපාය"
බත්තරමුල්ල.

දිනය : 2018.11.30

නිල මුද්‍රාව :

---

යොමු අංකය : PSC/EST/3/1/21/2012

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී බණ්ඩ 1 සේවා ගණය සඳහා වන මෙම උසස් කිරීමේ පරිපාටිය 2018.09.20 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :........................................

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

දිනය : 2018.12.13

නිල මුද්‍රාව :

# ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ
# ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධර බණ්ඩ 1 සේවා ගණය සඳහා
# I වන කාර්යක්ෂමතා කඩඉම

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. ආයතන හා මූල්‍ය පරිපාලනය | පැය 03 | 100 | 40 |
| 02. දෙපාර්තමේන්තු ව්‍යාවස්ථා හා කාර්ය පටිපාටි | පැය 02 | 100 | 40 |

02. විභාගය පවත්වනු ලබන බලධරයා : ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

03. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01.ආයතන හා මූල්‍ය පරිපාලනය | 1. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති<br>2. ආයතන සංග්‍රහයේ පළමු කාණ්ඩයෙහි VI,VII,VIII,XII,XIV,XVII, XIX,XXII,XXIII පරිච්ජේද පිළිබඳ අවබෝධතාව හා දැනුම<br>3. ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII හා XLVIII පරිච්ඡේද පිළිබඳ දැනුම<br>4. මුදල් රෙගුලාසි සංග්‍රහයේ I,III,IV,V,VI,VII,VIII,XI,XII,XIII,XIV පරිච්ජේද පිළිබඳ දැනුම |
| 02.දෙපාර්තමේන්තු ව්‍යවස්ථා හා කාර්ය පටිපාටි | 1. ජාතික ලේඛනාරක්ෂක කටයුතු වලට අදාළ අණ පනත් රෙගුලාසි හා නියෝග<br>2. ලේඛන පරිපාලනය හා සංරක්ෂණ මූලධර්ම<br>3. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා සංවිධාන ව්‍යුහය<br>4. සුරක්ෂිතාගාර ක්‍රියාවලිය සහ ඒවායෙහි තැන්පත් කර ඇති ලේඛන පිළිබඳ අවබෝධය හා දැනුම |

| | | | |
|---|---|---|---|
| සකස් කළේ | : | පරීක්ෂා කළේ | : |
| අත්සන | : [signature] | අත්සන | [signature] |
| නම | : ආර්.පී.එන්.ආර්.කේ. රාජපක්ෂ | නම | : බී.එම්. නිසංසලා බාලසූරිය |
| තනතුර | : පරිපාලන නිලධාරී | තනතුර | : සහකාර අධ්‍යක්ෂ (පාලන) |
| දිනය | : 2018.11.19 | දිනය | : 2018.11.19 |

බී. එම්. නිසංසලා බාලසූරිය
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.
නො. 07, පිලිප් ගුණවර්ධන මාවත.
කොළඹ 07.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : [signature]

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ආචාර්ය නදීරා රූපසිංහ

තනතුර : ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2018.11.19

නිල මුද්‍රාව :

ආචාර්ය නදීරා රූපසිංහ
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
අංක. 07, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

# ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත /කාර්යාලගත නිලධර බණ්ඩ 1 සේවා ගණය සඳහා II වන කාර්යක්ෂමතා කඩඉම

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. පෘතුග්‍රීසි හා ලන්දේසි භාෂාව | පැය 03 | 100 | 40 |
| 02. ලංකා ඉතිහාසය | පැය 03 | 100 | 40 |

02. විභාගය පවත්වනු ලබන බලධරයා : ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

03. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01 පෘතුග්‍රීසි හා ලන්දේසි භාෂාව | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පෘතුග්‍රීසි හා ලන්දේසි ලේඛනවල උද්ධෘත සිංහලට/ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම |
| 02. ලංකා ඉතිහාසය | නිදහසින් පසු ලංකා ඉතිහාසය |

සකස් කළේ :
අත්සන :....................
නම : ආර්.පී.එන්.ආර්.කේ. රාජපක්ෂ
තනතුර : පරිපාලන නිලධාරී
දිනය : 2018.11.19

පරීක්ෂා කළේ :
අත්සන :....................
නම : බී.එම්. නිසංසලා බාලසූරිය
තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)
දිනය : 2018.11.19

බී.එම්. නිසංසලා බාලසූරිය
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව,
නො. 07, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :....................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ආචාර්ය නදීරා රූපසිංහ
තනතුර : ජාතික ලේඛනාගාර අධ්‍යක්‍ෂ ජනරාල්
දිනය : 2018.11.19

ආචාර්ය නදීරා රූපසිංහ
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්
ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
නො. 07, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

නිල මුද්‍රාව :

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත ඛණ්ඩ 1 නිලධර ගණයෙහි තනතුරු වල නියමිත දිනට සේවයේ නියුතු නිලධාරීන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම

නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) මගින් ලබා දී ඇති MN 6-2006 (ඒ) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සහකාර ලේඛනාරක්ෂක තනතුරෙහි නිලධරයන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කොට ගෙන සේවා කාලය ගණන් ගත යුතුය. කෙසේ වුව ද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 4.4 වන වගන්තිය අනුව ඉහළ වැටුප් පියවරයේ තැබීම සිදු නොකළ යුතුය.

### I. MN 6-2006 (ඒ) II ශ්‍රේණිය සඳහා අන්තර්ග්‍රහණය කිරීම

(අ) MN 6-2006 (ඒ) වැටුප් පරිමාණයෙහි II වන ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති ලේඛන විමර්ශන නිලධාරී හා සහකාර ලේඛනාරක්ෂක තනතුරෙහි යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති නිලධාරීන්

(ආ) ඉහත සඳහන් පරිදි යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ වුවද I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධරයන්

MN 6-2006 (ඒ) වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

### II. MN 6-2006 (ඒ) I ශ්‍රේණිය සඳහා අන්තර්ග්‍රහණය කිරීම

(අ) MN 6-2006 (ඒ) වැටුප් පරිමාණයෙහි I වන ශ්‍රේණියට අදාල වැටුප් පියවර ලබා දී ඇති සහකාර ලේඛනාරක්ෂක නිලධාරීන් සියළු දෙනා MN 6-2006 (ඒ) වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සකස් කළේ :

අත්සන :..........................................

නම : ආර්.පී.එන්.ආර්.කේ. රාජපක්ෂ

තනතුර : පරිපාලන නිලධාරී

දිනය : 2018.11.19

පරීක්ෂා කළේ :

අත්සන :..........................................

නම : බී.එම්. නිසංසලා බාලසූරිය

තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)

දිනය : 2018.11.19

බී. එම්. නිසංසලා බාලසූරිය
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව,
නො. 07, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ආචාර්ය නදීරා රූපසිංහ

තනතුර : ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2018.11.19

නිල මුද්‍රාව :

ආචාර්ය නදීරා රූපසිංහ
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
නො. 07, පිලිප් ගුණවර්ධන මාවත
කොළඹ 07.